# මුඛ්තසර් අල්-ෆික්හුල් ඉස්ලාමි

## පිටුව ௭௨ – ௭௮

[ සිංහල – Sinhala – سنهالي ]


අෂ් ෂෙයික් තුවෙයිජිරි

පරිවර්තනය

මාහිර් රම්ඩීන්



2015 - 1436

IslamHouse.com

# مختصر الفقه الإسلامي

# الإيمان بالملائكة والكتب من صفحة ٧٢-٧٨

« باللغة السنهالية »

محمد بن إبراهيم بن عبد الله

نبذة مختصرة: مختصر الفقه الإسلامي مختصر سهل حوى بين جنبيه شرائع وروعي فيه إلقاء النفع على البيت المسلم على وجه الخصوص

ترجمة: ماهر رمدين

2015 - 1436

IslamHouse.com

# මුඛ්තසර් අල්-ෆික්හිල් ඉස්ලාමී

පිටුව 72-78

මාතෘකා

2- මලක්වරුන් පිළිබඳව විශ්වාස කිරීම

3- වේද ග්‍රන්ථ විශ්වාස කිරීම

# 2- මලක් වරුන් පිළිබඳ ව විශ්වාස කිරීම

- මලක් වරුන් විශ්වාස කිරීම යනු සැබැවින් ම අල්ලාහ් ගේ මලක් වරුන් සිටින බව ට ස්ථිර ලෙස තහවුරු කිරීම ය.

ඔවුන් අතුරින් ජිබ්රීල් වැනි අල්ලාහ් නම් කළ අයව ද ඔවුන් අතුරින් අප නම් නොදන්නා අයව ද විශ්වාස කළ යුතුය. එබැවින් ඔවුන් සියලු දෙනාව ම මුළුමණින් ම විශ්වාස කළ යුතුය. ඔවුන් ගේ ගුණාංගයන් හා ඔවුන් ගේ ක්‍රියාවන් පිළිබඳ අප කුමක් දැන සිටින්නේ ද එය අපි විශ්වාස කළ යුත්තෝ වෙමු.

ඔවුන් තරාතිරම් අනුව :

ඔවුහු ගැතිකම් කරන ගෞරවයෙන් හෙබි අය වෙති. අල්ලාහ් ට නැමදුම් කරමින් සිටින අය වෙති. නමුත් ඔවුන ට රුබූබිය්යත් හෝ උලූහිය්යත් යන්නෙහි විශේෂත්වයක් නොමැත. ඔවුහු මිනිසා නොදත් සැඟවුණු දෑ දනිති. අල්ලාහ් ඔවුන් ව ආලෝකයෙන් මවා ඇත.

عَنْ عَائِشَةَ رضي الله عنها قَالَتْ : قَالَ رَسُولُ اللَّهِ صَلَّى اللَّهُ عَلَيْهِ وَسَلَّمَ : "خُلِقَتِ الْمَلَائِكَةُ مِنْ نُورٍ وَخُلِقَ الْجَانُّ مِنْ مَارِجٍ مِنْ نَارٍ وَخُلِقَ آدَمُ مِمَّا وُصِفَ لَكُمْ" أخرجه مسلم

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමා ප්‍රකාශ කළ බව ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කරන ලදී.

මලක් වරුන් ආලෝකයෙන් මවනු ලැබීය. ජින්නුන් ගිනි ජාලාවෙන් මවනු ලැබීය. මිනිසා නුඹලා ට වර්ණනය කළ අයුරින් මවනු ලැබීය.

මෙය ඉමාම් මුස්ලිම් විසින් හෙළිදරව් කර ඇත.

ඔවුන් ගේ ක්‍රියාවන් අනුව :

ඔවුහු අල්ලාහ් නමදිති. ඔහු ව සුවිශුද්ධ කරති. ඔවුන ට අණ කරනු ලැබූ දෑ එලෙසම ඉටු කරති.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

**وَلَهُ مَنْ فِي السَّمَاوَاتِ وَالْأَرْضِ وَمَنْ عِنْدَهُ لَا يَسْتَكْبِرُونَ عَنْ عِبَادَتِهِ وَلَا يَسْتَحْسِرُونَ ، يُسَبِّحُونَ اللَّيْلَ وَالنَّهَارَ لَا يَفْتُرُونَ**

අහස් හි හා මිහිතලයේ සිටින්නන් ඔහු සතු ය. ඔහු අබියස සිටින්නවුන් ඔහු ට නැමදුම් කිරීමෙන් අහංකාර නොවන්නෝ ය. උදාසීන ද නොවන්නෝය.

රාත්‍රියෙ හි හා දහවලෙ හි පිවිතුරු කරන්නෝ ය. වෙහෙසට පත් නොවන්නෝ ය. (අල්-කුර්ආන් 21:19,20)

ඔවුන් අල්ලාහ් ට අවනත වීම අනුව :

අල්ලාහ් ගේ නියෝගයන් ට මුළුමණින් ම යටහත් වීමත් ඒවා ක්‍රියාත්මක කිරීමේ ශක්තියත් ඔහු ඔවුන් ට පිරිනමා ඇත. ඔවුන් යටහත් වීම ට බල කෙරෙනු ලැබූ අයය.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

لَا يَعْصُونَ اللَّهَ مَا أَمَرَهُمْ وَيَفْعَلُونَ مَا يُؤْمَرُونَ

ඔවුන ට අල්ලාහ් විධානය කළ දෑ ට ඔවුහු පිටු නොපාති. ඔවුන ට අණ කරනු ලබන දෑ ඔවුහු ඉටු කරති. (අල්-කුර්ආන් 66 : 6)

- මලක්වරුන් ගේ සංඛ්‍යාව

මලක්වරු බොහෝමයක් සිටිති. ඔවුන් ව අල්ලාහ් හැර වෙන කිසිවෙකු ට ගණන් කළ නොහැක. ඔවුන් අතුරින් අර්ෂ් හෙවත් අල්ලාහ් ගේ රාජධානිය උසුලමින් සිටින්නන් ද ස්වර්ගය ට භාර ව සිටින්නන් ද නිරය ට භාර ව සිටින්නන් ද මුරකාවලුන් ද ලේඛකයින් ද මේ හැර

වෙනත් කාර්යයන් නියම කරනු ලැබූ අය ද වෙති. එමෙන් ම හැත්තෑ දහසක් මලක්වරු සෑම දිනක ම බයිතුල් මඃමූර් හි සලාතය ඉටු කරති. ඔවුන් එයින් පිට ව ගියේ නම් ඔවුන් ගේ අවසානය දක්වා නැවත ඒ වෙත නොපැමිණෙති.

ففي قصة المعراج أن النبي صلى الله عليه وسلم لما أتى السماء السابعة قال : "ثُمَّ رُفِعَ لِي الْبَيْتُ الْمَعْمُورُ فَقُلْتُ يَا جِبْرِيلُ مَا هَذَا قَالَ هَذَا الْبَيْتُ الْمَعْمُورُ يَدْخُلُهُ كُلَّ يَوْمٍ سَبْعُونَ أَلْفَ مَلَكٍ إِذَا خَرَجُوا مِنْهُ لَمْ يَعُودُوا فِيهِ آخِرُ مَا عَلَيْهِمْ" . متفق عليه.

මිඃරාජ් සිද්ධියේ දී සැබැවින් ම නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් සත් වැනි අහස ට පැමිණි කල් හි. ඒ පිළිබඳ ව එතුමාණන් පවසා සිටිය දී ...

... එකල් හි බයිතුල් මඃමූර් නම් ස්ථානය මට ඔසවා පෙන්වන ලදී. එවිට ජිබ්රීල්ගෙන් විමසා සිටියෙමි. එයට ඔහු :

මෙය බයිතුල් මඃමූර් ය එහි සෑම දිනක ම හැත්තෑ දහසක් මලක්වරු සලාතය ඉටු කරති. ඔවුන් එයින් පිට ව ගියේ නම් ඔවුන් ගේ අවසානය දක්වා නැවත ඒ වෙත නොපැමිණෙති.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

- නාමයන් හා මලක් වරුන් ගේ ක්‍රියාවන්

මලාඉකාවරු ගෞරවනීය ය. අල්ලාහ් ට ගැතිකම් කරන්නන් ය. තමන් ට අවනත ව කටයුතු කිරීමටත් තමන් ව නැමදීමටත් ඔවුන් ව අල්ලාහ් මවා ඇත.

ඔවුන් අතුරින් ඇතැමුන් ව ඔවුන් ගේ නාමයන් සමඟ ම අල්ලාහ් විශේෂ කොට පවසා ඇත.

1. ජිබ්රීල් (අලෛයිහිස් සලාම්) : මොහු නබි වරුන් හෙවත් වක්තෘ වරුන් රසූල් වරුන් හෙවත් දේව ධර්ම දූතයින් (අලෛයිහිමුස් සලාම්) වෙත දේව පණිවුඩ දන්වා සිටීමේ වගකීම දැරූ අය වේ.

2. මීකාඊල් (අලෛයිහිස් සලාම්) : මොහු වර්ෂාව, ගහ කොළ හා පැළෑටි සම්බන්ධයෙන් භාර ව කටයුතු කරන අය වේ.

3. ඉස්රාෆීල් (අලෛයිහිස් සලාම්) : හොරණෑවෙ හි පිඹීම ට භාර ව සිටිය අය වේ.

මොවුහු ඉතා ප්‍රධාන මලක් වරුන් වෙති. ජීවිතයේ සාධකයන් පිළිබඳ ව වගකීම් පවරනු ලැබූවන් ය.

ඒ අනුව ජිබ්රීල් (අලෛයිහිස් සලාම්) තුමා හදවත් ජීවමාන කරවන දේව පණිවිඩ දන්වා සිටීම සම්බන්ධයෙන් භාර ව කටයුතු කළ අයෙකි. මීකාඊල් (අලෛයිහිස් සලාම්) තුමා මහපොළොව මළ පසු ව එය ජීවමාන කරන වර්ෂාව

සම්බන්ධයෙන් භාර ව ය කටයුතු කරන අයෙකි. එමෙන් ම ඉස්රාෆීල් (අලෛයිහිස් සලාම්) තුමා මිනිසා මිය ගිය පසු ව ශරීර යළි ජීවමාන කරවන්න ට මවා ඇති හොරණෑවෙහි පිඹීමේ වගකීම දරන අයෙකි.

4. මාලික් (අලෛයිහිස් සලාම්): මොහු නිරය සම්බන්ධයෙන් භාර ව කටයුතු කරන අය වේ.

5. රිල්වාන් (අලෛයිහිස් සලාම්) මොහු ස්වර්ගය සම්බන්ධයෙන් භාර ව කටයුතු කරන අය වේ.

මරණ අවස්ථාවේ ප්‍රාණයන් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් භාර ව කටයුතු කරන 'මලකල් මව්ත්' හෙවත් මරණයේ මලක් වරයෙකු ද ඔවුන් අතුරින් වෙයි.

තව ද අර්ෂය උසුලා ගෙන සිටින අය ද ස්වර්ගය ට භාර ව කටයුතු කරන අය ද නිරය ට භාර ව කටයුතු කරන අය ද කඳු සම්බන්ධයෙන් භාර ව කටයුතු කරන අය ද මුහුදු සම්බන්ධයෙන් භාර ව කටයුතු කරන අය ද ඔවුන් අතුරින් වෙති.

ආදම් ගේ දරුවන් වන මිනිසා ආරක්ෂා කරන ඔවුන් ගේ ක්‍රියාවන් ආරක්ෂා කරන සෑම කෙනෙකුගේ ම වාර්තාවන් සටහන් කරන මලක් වරුන් ද ඔවුන් අතුරින් වෙති.

අල්ලාහ් ගේ ගැත්තා සමඟ ම සදාකල් වෙසෙන මලක් වරුන් ද ඔවුන් අතුරින් වෙති.

ගර්භාෂයන් හි ඇති කළලයන් සම්බන්ධයෙන් භාර ව කටයුතු කරන මලක් වරුන් ද ඔවුන් අතුරින් වෙති. ඔවුහු එහි මිනිසා ගේ රිස්ක් හෙවත් පෝෂණ සම්පත් ඔහු ගේ ක්‍රියාවන් ඔහු ගේ ආයුෂ කාලය ඔහු භාග්‍යවන්තයෙක් ද අභාග්‍යවන්තයෙක් ද යන වග අල්ලාහ් ගේ නියෝගය පරිදි සටහන් කරති.

මිනිසා මිය ගිය පසු ව ඔහු ගේ මිණී වළ තුළ ඔහු ගේ පරමාධිපති ගැන ද ඔහු ගේ දහම ගැන ද ඔහු ගේ නබි වරයා ගැන ද විමසා සිටින මලක් වරුන් ද ඔවුන් අතුරින් වෙති. මොවුන් හැර කිසිවෙකු ට ගණන් කළ නොහැකි තරම ට බොහෝ මලක්වරුන් ද සිටිති. සියලු දෑ ගණනය කරන අල්ලාහ් හැර වෙන කිසිවෙකු ට මොවුන් ව ගණන් කළ නොහැක.

- ගෞරවනීය ලේඛකයන් ගේ කාර්ය භාරය.

අල්ලාහ් ගෞරවනීය ලේඛකයින් වන මලක් වරුන් මවා ඇත. ඔවුන් ව අප ට ආරක්ෂකයින් බව ට පත් කර ඇත. ඔවුහු අප කරන ක්‍රියාවන් අප කතා කරන ප්‍රකාශයන් හා සිතන චේතනාවන් අල්ලාහ්ගේ අනුදැනුම මත සටහන් කරති. සෑම මිනිසෙකු සමඟ ම මලක්වරු දෙදෙනෙකු සිටිති. දකුණු දෙසින් සිටින්නා යහපත සටහන් කරයි. වම් දෙසින් සිටින්නා පාපය සටහන් කරයි. තවත් මලක්වරු දෙදෙනෙක් ඔහු ට රැකවරණය ලබා දෙති. ඔහු ව ආරක්ෂා කරති. එක් අයෙකු ඔහු ට ඉදිරියෙන් ද තවත් අයෙකු ඔහු ට පසු පසින් ද සිටියි.

1. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

وَإِنَّ عَلَيْكُمْ لَحَافِظِينَ ، كِرَامًا كَاتِبِينَ ، يَعْلَمُونَ مَا تَفْعَلُونَ

සැබැවින් ම ගෞරවය ට පාත්‍ර වූ (නුඹලා ගේ සියලු කටයුතු) සටහන් කරන ආරක්ෂකයින් නුඹලා ට වෙති. නුඹලා කරන දෑ ඔවුහු දනිති. (අල්-කුර්ආන් 82 : 10 – 12)

2. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

وَلَقَدْ خَلَقْنَا الْإِنْسَانَ وَنَعْلَمُ مَا تُوَسْوِسُ بِهِ نَفْسُهُ وَنَحْنُ أَقْرَبُ إِلَيْهِ مِنْ حَبْلِ الْوَرِيدِ ، إِذْ يَتَلَقَّى الْمُتَلَقِّيَانِ عَنِ الْيَمِينِ وَعَنِ الشِّمَالِ قَعِيدٌ ، مَا يَلْفِظُ مِنْ قَوْلٍ إِلَّا لَدَيْهِ رَقِيبٌ عَتِيدٌ

.

තව ද සැබැවින් ම අපි මිනිසා මැව්වෙමු. ඔහු ගේ ආත්මාව සිතන දෑ අපි දනිමු. තව ද අපි (ගෙලෙහි) ශීර්ෂ ශිරාව ට වඩා ඔහු ට සමීපයෙන් සිටින්නෙමු. දකුණු පසින් ද වම් පසින් ද හිඳ සටහන් කරන දෙදෙනා සටහන් කරන කල් හි, නිවැරදි ව සටහන් කරන්නන් ඔහු අබියස (සටහන් කරමින්) මිස කිසිදු වදනක් ඔහු උච්චාරණය නොකරන්නේ ය. (අල්-කුර්ආන් 50 : 16 - 18)

3. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

سَوَاءٌ مِنْكُمْ مَنْ أَسَرَّ الْقَوْلَ وَمَنْ جَهَرَ بِهِ وَمَنْ هُوَ مُسْتَخْفٍ بِاللَّيْلِ وَسَارِبٌ بِالنَّهَارِ، لَهُ مُعَقِّبَاتٌ مِنْ بَيْنِ يَدَيْهِ وَمِنْ خَلْفِهِ يَحْفَظُونَهُ مِنْ أَمْرِ اللَّهِ ...

නුඹලා අතුරින් කතාව සඟවන්නා ද එය හෙළි කරන්නා ද රාත්‍රියෙහි සැඟ වී සිටින්නා ද දහවලෙහි සැරිසරන්නා ද (අල්ලාහ් ට) එක සමාන ය. (මිනිසා වන) ඔහු ට ඉදිරියෙන් ද ඔහු ට පසු පසින් ද ලුහු බැඳ පැමිණෙන්නන් (වන මලක් වරුන්) සිටින්නේ ය. ඔවුහු අල්ලාහ් ගේ නියෝගය පරිදි ඔහුව ආරක්ෂා කරති...

(අල්-කුර්ආන් 13: 10,11)

4.

عَنْ أَبِي هُرَيْرَةَ رضي الله عنه أَنَّ رَسُولَ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ قَالَ : "يَقُولُ اللَّهُ : إِذَا أَرَادَ عَبْدِي أَنْ يَعْمَلَ سَيِّئَةً فَلَا تَكْتُبُوهَا عَلَيْهِ حَتَّى يَعْمَلَهَا فَإِنْ عَمِلَهَا فَاكْتُبُوهَا بِمِثْلِهَا وَإِنْ تَرَكَهَا مِنْ أَجْلِي فَاكْتُبُوهَا لَهُ حَسَنَةً وَإِذَا أَرَادَ أَنْ يَعْمَلَ

حَسَنَةً فَلَمْ يَعْمَلْهَا فَاكْتُبُوهَا لَهُ حَسَنَةً فَإِنْ عَمِلَهَا فَاكْتُبُوهَا لَهُ بِعَشْرِ أَمْثَالِهَا إِلَى سَبْعِ مِائَةِ ضِعْفٍ

අල්ලාහ් මෙසේ පවසා සිටින්නේ යැයි සැබැවින් ම අල්ලාහ් ගේ දූතයාණන් ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

මාගේ ගැත්තා යම් පාපයක් සිදු කිරීම ට අපේක්ෂා කළේ නම් එවිට එය ඔහු ඉටු කරන තෙක් ඔහු ට එරෙහි ව නුඹලා නොලියනු. එසේ ඔහු එය කළේ නම් ඒ හා සමාන දෙයක් පමණක් එය ට ලියනු. නමුත් මා වෙනුවෙන් ඔහු එය අත හැර දැමුවේ නම් එවිට ඒ වෙනුවෙන් ඔහු ට යහපතක් නුඹලා සටහන් කරනු. එමෙන්ම ඔහු යහපතක් සිදු කිරීම ට අපේක්ෂා කොට පසු ව එය ඔහු සිදු නොකළේ නම් එවිට ඔහු වෙනුවෙන් එය යහපතක් ලෙස සටහන් කර ගනු. එය ඔහු කළේ නම් ඔහු වෙනුවෙන් ඒ හා සමාන දහස් ගුණයක සිට හත් සීය ගුණය දක්වා එය නුඹලා සටහන් කරනු.

මූලාශ්‍රය : (බුහාරි හා මුස්ලිම්)

## මලක් වරුන් ගේ මැවීමේ විශාලත්වය

මැවීම් අතුරින් අති මහත් මැවීමකි මලක්වරු. අල්ලාහ් ඔවුන් ව ආලෝකයෙන් මැව්වේ ය. මැවීමේ විශාලත්වය අනුව ඔවුන් එකිනෙකා වෙනස් වෙති.

ජිබ්රීල් (අලෛයිහිස් සලාම්) : මලක්වරුන් අතුරින් අති විශාලතම මලක්වරයා වනුයේ ජිබ්රීල් (අලෛයිහිස් සලාම්) තුමා ය. ඔහු ට තටු හයසීයක් ඇත. ඉන් එක තටුවක් ක්සිතිජයම ආවරණය කළ හැකි පරිදි පිහිටා ඇත. එතුමා ගේ තටුවක එක් පැත්තකින් ලූත් නබිතුමා ගේ ජනයා විසූ ගම්මාන අතුරින් ගම් පහක් අහස දෙස ට ඔසවා පසු ව එහි සිටි අය ව උඩි යටිකුරු ලෙස පෙරළා දැමීය. අද අපි මළ මුහුද යැයි පවසනුයේ එම ස්ථානයයි.

එසේ නම් එතුමා ගේ සම්පූර්ණ තටුවක ශක්තිය කෙතරම් විය හැකි ද ! එතුමා ගේ තටු හයසියයේ ශක්තිය කෙතරම් විය හැකි ද ? එතුමා ගේ පාද දෙකෙහි ශක්තිය කෙතරම් විය හැකි ද ? එතුමා ගේ මුළු ශරීරයේ ශක්තිය කෙතරම් විය හැකි ද ? එසේ නම් මෙම අති දැවැන්ත මැවීම මැවූ පරමාධිපති අල්ලාහ් ගේ ශක්තිය කෙතරම් විය හැකි ද ?

ඉස්රාෆීල් (අලෛයිහිස් සලාම්) : සූර් නම් හොරණෑව පිඹීම ට වගකීම පැවරී ඇති මලක්වරයා ඉස්රාෆීල් (අලෛයිහිස් සලාම්) තුමා ය. එක් වරක් එතුමා එම හොරණෑවෙන් පිඹින විට අහස් හි හා මහපොළොවේ සිටින සියලු දෙනා පොඩි පට්ටම් වී යනු ඇත. එහි දෙවන වතාව ට පිඹින විට ඔවුන් ජීවී ව නරඹන්නන් ලෙස අවදි වෙති.

මෙය ඔහු ගේ පිඹීමේ ශක්තියයි. එසේ නම් ඔහුගේ ශරීරයේ ශක්තිය කෙතරම් විය හැකි ද ? මෙම දැවැන්ත මැවීම මැවූ අල්ලාහ් ගේ ශක්තිය කෙතරම් විය හැකි ද ?

අර්ෂ් හෙවත් දේව රාජ්‍යය උසුලා සිටින මලක්වරු : කන් පෙත්තක සිට උරහිස දක්වා වර්ෂ හත්සීයක් ගමන් කරන

තරම ට ඔවුන් ගේ විශාලත්වය පිහිටා ඇත. එසේ නම් හිස සිට පාදය දක්වා පිහිටා ඇති දුර ප්‍රමාණය කෙරතම් විය හැකි ද ? මෙම දැවැන්ත මැවීම මැවූ මැවුම්කරු ගේ විශාලත්වය කෙතරම් විය හැකි ද ?

1. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

الْحَمْدُ لِلَّهِ فَاطِرِ السَّمَاوَاتِ وَالْأَرْضِ جَاعِلِ الْمَلَائِكَةِ رُسُلًا أُولِي أَجْنِحَةٍ مَثْنَى وَثُلَاثَ وَرُبَاعَ يَزِيدُ فِي الْخَلْقِ مَا يَشَاءُ إِنَّ اللَّهَ عَلَى كُلِّ شَيْءٍ قَدِيرٌ

අහස් හා මිහිතලය මුලින් උත්පාදනය කළා වූ ද පියාපත් දෙක බැගින් ද තුන බැගින් ද සතර බැගින් ද වූ මලක් වරුන් ව දූතයන් ලෙස පත් කළා වූ ද අල්ලාහ්ට ම සියලු ප්‍රශංසා. මැවීම් හි ඔහු අභිමත වූ දෑ අධික කරන්නේ ය. සැබැවින් ම අල්ලාහ් සියලු දෑ කෙරෙහි අති බලසම්පන්න ය. (අල්-කුර්ආන් 35 : 1)

2.

وعن ابن مسعود رضي الله عنه ان محمدا صلى الله عليه وسلم " رأى جِبْرِيْلَ لَهُ سِتُّمِائَةِ جَنَاح " متفق عليه.

සැබැවින් ම නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් ජිබ්රීල් (අලෛයිහිස් සලාම්) තුමා ව තටු හයසීක්

සහිත ව දුටු බව ට ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

3.

وَعَنْ جَابِرِ بْنِ عَبْدِ اللَّهِ رضي الله عنهما عَنِ النَّبِيِّ صَلَّى اللَّهُ عَلَيْهِ وَسَلَّمَ قَالَ : " أُذِنَ لِي أَنْ أُحَدِّثَ عَنْ مَلَكٍ مِنْ مَلَائِكَةِ اللهِ مِنْ حَمَلَةِ الْعَرْشِ إِنَّ مَا بَيْنَ شَحْمَةِ أُذُنِهِ إِلَى عَاتِقِهِ مَسِيرَةُ سَبْعِ مِائَةِ عَامٍ " أخرجه أبو داود.

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා ප්‍රකාශ කළ බව ජාබිර් ඉබ්නු අබ්දිල්ලාහ් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

අර්ෂ් හෙවත් දේව රාජධානිය උසුලා සිටින අල්ලාහ් ගේ මලක් වරුන් පිළිබඳ පවසා සිටින මෙන් මට පවසන ලදී. සැබැවින් ම කන් පෙත්තක සිට උරහිස දක්වා අතර ඇති විශාලත්වය වර්ෂ හත්සීයක් ගමන් කරන තරම ට පිහිටා ඇත.

මෙය ඉමාම් අබූ දාවූද් විසින් දන්වා ඇත.

- මලක් වරුන් විශ්වාස කිරීමේ ප්‍රතිඵල

1- අල්ලාහ් ගේ බලය ඔහු ගේ ශක්තිය ඔහු ගේ හැකියාව ඔහු ගේ ප්‍රඥාව හා ඔහු ගේ කරුණා ව

පිළිබඳ ව දැන ගත හැකි වේ. අල්ලාහ් මලක් වරුන් මැව්වේ ය. ඔහු හැර වෙන කිසිවෙකු ට ඔවුන් ගේ සංඛ්‍යාව පිළිබඳ දැනුමක් නොමැත. අර්ෂ් හෙවත් සර්ව රාජ්‍යය උසුලා සිටින මලක් වරුන් ද ඔවුන් අතුරින් වෙති. එක් අයකු ගේ විශාලත්වයේ තරම ඔහු ගේ කන් පෙත්තේ සිට ඔහු ගේ උරහිස දක්වා වසර හත් සියයක් ගමන් කරන දුරවෙති. එසේ නම් අර්ෂ් හි විශාලත්වය කෙසේ නම් විය හැකි ද? අර්ෂය ට ඉහළින් සිටින්නා ගේ විශාලත්වය කෙසේ නම් විය හැකි ද? එබැවින් සියලු රාජ්‍යයන් හිමි අල්ලාහ් සුවිශුද්ධ ය.

උත්තරීතර අල්ලාම් මෙසේ ප්‍රකාශ කරයි.

وَلَهُ الْكِبْرِيَاءُ فِي السَّمَاوَاتِ وَالْأَرْضِ وَهُوَ الْعَزِيزُ الْحَكِيمُ

අහස් හි හා මිහිතලයේ ඉමහත් ආඩම්බරය ඔහු සතු ය. ඔහු අති බලසම්පන්න ය. සර්ව ප්‍රඥාවන්ත ය.

(අල්-කුර්ආන් 45 : 37)

2- අල්ලාහ් ආදම් ගේ දරුවන් කෙරෙහි තබා ඇති අවධානය වෙනුවෙන් ඔහු ට ප්‍රශංසා කොට තුති පුද කිරීම ට හැකි වීම. එසේ ඔහු ගේ අවධානය යොමු කරනුයේ ඔවුන් ව ආරක්ෂා කිරීම ට ඔවුන්

ට උදව් උපකාර කිරීම ට ඔවුන් ගේ ක්‍රියාවන් ලේකන ගත කිරීමට ඔවුන ට ප්‍රාර්ථනා කිරීම ට මලක් වරුන් අතුරින් ඇතැමුන් ට භාරකාරත්වය පිරිනැමීමෙනි.

3- අල්ලාහ් ගේ ගැත්තන් අතුරින් කවර කෙනෙකු විෂයෙහි මලක් වරුන් කටයුතු කරන්නේ ද එවැනි දේව විශ්වාසවන්තයින් එම මලක් වරුන් ගේ ආදරය ට ප්‍රාර්ථනය ට හා ඔවුන් වෙනුවෙන් පාප ක්ෂමා ව අයැද සිටීමේ තත්ත්වය ට ලක් වීම.

අර්ෂය උසුලා සිටින හා තමන් අවට සිටින මලක් වරුන් පිළිබඳ ව අල්ලාහ් මෙසේ ප්‍රකාශ කර සිටියි.

الَّذِينَ يَحْمِلُونَ الْعَرْشَ وَمَنْ حَوْلَهُ يُسَبِّحُونَ بِحَمْدِ رَبِّهِمْ وَيُؤْمِنُونَ بِهِ وَيَسْتَغْفِرُونَ لِلَّذِينَ آمَنُوا رَبَّنَا وَسِعْتَ كُلَّ شَيْءٍ رَحْمَةً وَعِلْمًا فَاغْفِرْ لِلَّذِينَ تَابُوا وَاتَّبَعُوا سَبِيلَكَ وَقِهِمْ عَذَابَ الْجَحِيمِ ، رَبَّنَا وَأَدْخِلْهُمْ جَنَّاتِ عَدْنٍ الَّتِي وَعَدْتَهُمْ وَمَنْ صَلَحَ مِنْ آبَائِهِمْ وَأَزْوَاجِهِمْ وَذُرِّيَّاتِهِمْ إِنَّكَ أَنْتَ الْعَزِيزُ الْحَكِيمُ

، وَقِهِمُ السَّيِّئَاتِ وَمَنْ تَقِ السَّيِّئَاتِ يَوْمَئِذٍ فَقَدْ رَحِمْتَهُ وَذَلِكَ هُوَ الْفَوْزُ الْعَظِيمُ.

අර්ෂය උසුලන්නන් ද එය වටා සිටින්නන් ද ඔවුන් ගේ පරමාධිපතිගේ පැසසුම තුළින් පිවිතුරු කර ඔහු(අල්ලාහ්)ව විශ්වාස කරන්නෝ ය. තවද විශ්වාස කළවුන් වෙනුවෙන් පාප ක්ෂමා ව අයැදින්නෝ ය. අප ගේ පරමාධිපතියාණනි, ඔබ දයාලු භාවයෙන් හා ඥානයෙන් සියලු දෑ වටලා ගත්තේ ය. එබැවින් පශ්චාත්තාපයේ යෙදී ඔබ ගේ මාර්ගය අනුගමනය කරන්නන් ට පාප ක්ෂමාව පිරිනමනු මැනව ! තව ද නිරයේ දඬුවමින් ඔවුන් ව ආරක්ෂා කරනු මැනව !

අප ගේ පරමාධිපතියාණනි, ඔබ ඔවුන් ට ප්‍රතිඥා කළ නිත්‍ය වූ ස්වර්ගය ට ඔවුන් ව හා ඔවුන් ගේ පියවරුන්ගෙන් ද ඔවුන් ගේ බිරියන්ගෙන් ද ඔවුන් ගේ පරපුරෙන් ද කවුරුන් (විශ්වාස කර) යහකම් කළේ ද ඔවුන් ව ද ඇතුළු කරනු මැනව ! සැබැවින් ම ඔබම ය අති බල සම්පන්න සර්ව ප්‍රඥාවන්ත වන්නේ.

පාප ක්‍රියාවන්ගෙන් ඔවුන් ව ආරක්ෂා කරනු මැනව! එදින ඔබ කවරෙකු ව පාප ක්‍රියාවන්ගෙන් ආරක්ෂා කළේ ද සැබැවින් ම ඔබ ඔහුට කරුණාව දැක් වූයේය. තවද එයමය මහත් වූ ජයග්‍රහණය වන්නේ. (අල්-කුර්ආන් 40 : 7 – 9)

# 3- වේද ග්‍රන්ථ විශ්වාස කිරීම

වේද (දේව) ග්‍රන්ථ විශ්වාස කිරීම යනු සැබැවින් ම උත්තරීතර අල්ලාහ් තම ගැත්තන් ට මහ පෙන්වීමක් වශයෙන් ඔහු ගේ නබි වරුන් හා ඔහු ගේ රසූල්වරුන් වෙත ට වේද ග්‍රන්ථ පහළ කළ බව හා එය සැබෑ අල්ලාහ් ගේ වදනකි. එහි අන්තර්ගත ව ඇති දෑ සත්‍යයකි. එහි කිසිදු සැකයක් නොමැත යනුවෙන් ස්ථිර ලෙසින් ම තහවුරු කිරීම ය.

ඒවා අතුරින් අල්-කුර්ආනයේ නමින් ම සඳහන් කළ දෑ ඇත. එමෙන් ම ඒවායෙ හි නාමයන් හා සංඛ්‍යාවන් අල්ලාහ් හැර වෙන කිසිවෙකු නොදන්නා දෑ ද ඇත.

- අල්-කුර්ආනයේ සඳහන් වන දිව්‍යමය වේද ග්‍රන්ථ වල සංඛ්‍යාව

  පහත සඳහන් වේද ග්‍රන්ථ තමන් පහළ කළ බව ට අල්-කුර්ආනයේ අල්ලාහ් පැහැදිලි කර ඇත.

1. ඉබ්‍රාහීම් (අලෛයිහිස් සලාම්) තුමාණන් වෙත පහළ කරනු ලැබූ දේව පත්‍රිකාවන්
2. තව්රාත් : මෙය මූසා (අලෛයිහිස් සලාම්) තුමා වෙත අල්ලාහ් පහළ කළ වේදයයි.
3. සබූර් : මෙය දාවූද් (අලෛයිහිස් සලාම්) තුමා වෙත අල්ලාහ් පහළ කළ වේදයයි.
4. ඉන්ජීල් : මෙය ඊසා (අලෛයිහිස් සලාම්) තුමා වෙත පහළ කළ වේදයයි.

5. අල්-කුර්ආනය : මෙය මුළු මිනිස් සංහතියට ම මඟ පෙන්වීමක් වශයෙන් අල්ලාහ් මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමා වෙත පහළ කළ වේදයයි.

පෙර පහළ වූ දිව්‍යම ය ග්‍රන්ථ විශ්වාස කිරීමේ හා ඒ අනුව ක්‍රියා කිරීමේ නීතිය.

සැබැවින් ම අල්ලාහ් මෙම වේද ග්‍රන්ථ පහළ කළ බව ට අපි විශ්වාස කළ යුතුයි. අල්-කුර්ආනයේ තොරතුරු මෙන් ම පෙර වේද ග්‍රන්ථ කිසිඳු වෙනස් කිරීමකින් හෝ විකෘති කිරීමකින් තොරව පැවතෙන්නේ නම් ඒවායෙහි පැවසෙන නිවැරදි තොරතුරු ද සත්‍ය බව විශ්වාස කළ යුතුය. ඒවායෙ හි නීති කිසිදු වෙනස් කිරීමක් අල්-කුර්ආනය හෝ සුන්නාහ් ව සිදු කර නොමැති නම් එම නීතීන් ට යටත් වී ඒවා පිළි ගෙන අප ක්‍රියා කළ යුතුය.

නාමයන් සඳහන් නොකළ දිව්‍යම ය ග්‍රන්ථ පිළිබඳ ව පොදුවේ ඒ සියල්ල අල්ලාහ් විසින් පහළ කර ඇති බව විශ්වාස කළ යුතුය. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

آمَنَ الرَّسُولُ بِمَا أُنْزِلَ إِلَيْهِ مِنْ رَبِّهِ وَالْمُؤْمِنُونَ كُلٌّ آمَنَ بِاللَّهِ وَمَلَائِكَتِهِ وَكُتُبِهِ وَرُسُلِهِ لَا نُفَرِّقُ بَيْنَ أَحَدٍ مِنْ رُسُلِهِ وَقَالُوا سَمِعْنَا وَأَطَعْنَا غُفْرَانَكَ رَبَّنَا وَإِلَيْكَ الْمَصِيرُ

රසූල් වරයා තමන් ගේ පරමාධිපතිගෙන් තමන් වෙත පහළ කරනු ලැබූ දෑ පිළිබඳ ව විශ්වාස කළ අතර මුඃමින්වරු ද (විශ්වාස කළහ.) සියල්ලෝම අල්ලාහ්ව ද ඔහු ගේ මලක් වරුන්ව ද ඔහු ගේ ග්‍රන්ථ ද ඔහු ගේ රසූල් වරුන්ව ද විශ්වාස කළහ. ඔහු ගේ රසූල් වරුන්ගෙන් කිසිවෙකු අතර අපි ප්‍රභේදයන් ඇති නොකළෙමු. තව ද අපි ශ්‍රවණය කළෙමු. අවනත වූයෙමු. අප ගේ පරමාධිපතියාණනි, ඔබ ගේ සමාව (අයැදිමු.) අවසානයේ යොමු වන ස්ථානය ඔබ වෙතම ය යැයි ඔවුහු පැවසුවෝය.

(අල්-කුර්ආන් 2 : 285)

උත්තරීතර අල්ලාහ් පවසන පරිදි තව්රාත් ඉන්ජීල් සබූර් හා පෙර පහළ වූ සෙසු දිව්‍යමය සියලු ග්‍රන්ථ පාරිශුද්ධ අල්-කුර්ආනය පහළ වීමෙන් වෙනස් කරනු ලැබීය.

وَأَنْزَلْنَا إِلَيْكَ الْكِتَابَ بِالْحَقِّ مُصَدِّقًا لِمَا بَيْنَ يَدَيْهِ مِنَ الْكِتَابِ وَمُهَيْمِنًا عَلَيْهِ فَاحْكُمْ بَيْنَهُمْ بِمَا أَنْزَلَ اللَّهُ وَلَا تَتَّبِعْ أَهْوَاءَهُمْ عَمَّا جَاءَكَ مِنَ الْحَقِّ

අපි ඔබ වෙත සත්‍යයෙන් යුත් පුස්තකය(අල්-කුර්ආනය) එය ට පෙර තිබූ පුස්තකයෙන් වූ දෑ සත්‍ය කරවන්නක්

වශයෙන් ද එය ආරක්ෂා කරන්නක් වශයෙන් ද පහළ කළෙමු. එබැවින් අල්ලාහ් පහළ කළ දැයින් ඔවුන් අතර නුඹ විනිශ්චය කරවු. (අල්-කුර්ආන් 5 : 47)

- වේද ග්‍රන්ථ අතුරින් ආගම් ලත් ජනයා සතු ව පවතින දෑ හි නීතිය.

තව්රාත් (තෝරාව) ඉන්ජීල් (බයිබලය) යන නාමයෙන් පුස්තක ලත් ජනයා අතර දැන ට පවතින ග්‍රන්ථ මුළුමණින්ම අල්ලාහ්ගේ නබි වරුන් වෙත ට ඔහු ගේ ධර්ම දූතයින් වෙත ට පහළ වූවක් බව පැවසීම නිවැරදි නොවේ. හේතුව දැන ට පවතින ඒ දෙකෙහි ම වෙනස් කිරීම් විකෘති කිරීම් සිදු වී ඇත. උදාහරණ වශයෙන් අල්ලාහ් ට පුතෙකු ඇති බව ට සම්බන්ධ කිරීම මර්යම් ගේ පුත් ඊසා ට දේවත්වය ඇදීම මැවුම්කරු ට නොගැළපෙන වර්ණනාවලින් වර්ණනා කිරීම නබි වරුන් ට දෝෂාරෝපනය කිරීම වැනි දෑ පෙන්වා දිය හැක. මේ සියල්ල පිටු දැකීම අනිවාර්ය ය. අල්-කුර්ආනයෙ හි හෝ සුන්නාහ්වෙ හි පැමිණ ඇති දෑ හැර සෙසු දෑ ප්‍රතික්ෂේප කිරීම එය සැබෑ විශ්වාස තහවුරු කිරීමකි.

පුස්තක ලත් ජනයා සමඟ අප කතා කරන විට ඔවුන් අපි සත්‍යවාදීන් ලෙස නොපැවසිය යුතුය. එමෙන්ම ඔවුන් බොරුකාරයින් ලෙස ද නොපැවසිය යුතුය. නමුත් අපි අල්ලාහ්ව ද ඔහුගේ ග්‍රන්ථ ද ඔහුගේ ධර්ම දූතයින්ව ද විශ්වාස කළෙමු යැයි පැවසිය යුතුයි. ඔවුන් පැවසූ දෑ සැබෑවක් නම් අපි ඔවුන්ව බොරුකාරයින් ලෙස

නොපැවසිය යුතුය. ඔවුන් පැවසූ දෑ වැරදි නම් අපි ඔවුන්ව සත්‍යවාදීන් යැයි නොපැවසිය යුතුය.

- යුදෙව්වන් හා කිතුනුවන් පිළිබඳ නීතිය

සියලු නබි වරුන් ට පැමිණි සත්‍ය දහම වනුයේ ඉස්ලාමයයි. එයයි සත්‍යය. ඒ හැර සෙසු දෑ අසත්‍ය ය දෑ වේ.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

إِنَّ الدِّينَ عِنْدَ اللهِ الْإِسْلَامُ وَمَا اخْتَلَفَ الَّذِينَ أُوتُوا الْكِتَابَ إِلَّا مِنْ بَعْدِ مَا جَاءَهُمُ الْعِلْمُ بَغْيًا بَيْنَهُمْ وَمَنْ يَكْفُرْ بِآيَاتِ اللهِ فَإِنَّ اللهَ سَرِيعُ الْحِسَابِ

සැබැවින් ම අල්ලාහ් අබියස (පිළි ගත්) දහම වනුයේ ඉස්ලාමයයි. පුස්තකය දෙනු ලැබූ අය තමන් ට ඥානය පැමිණි පසු ව ඔවුනතර තිබූ ඊර්ෂ්‍යාව හේතුවෙන් මිස එහි ඔවුහු මත භේද ඇති කර නොගත්හ. අල්ලාහ් ගේ වදන් කවරෙකු ප්‍රතික්ෂේප කරන්නේ ද සැබැවින් ම විනිශ්චය කිරීමෙහි ඉතා වේගවත් (බව ඔහු දැන ගත යුතු)ය.

(අල්-කුර්ආන් 3 : 19)

යුදෙව්වන් ට හෝ කිතුනුවන් ට හෝ දිව්‍යමය දහමක් නොමැත. යුදෙව්වන් මූසා (අලෙයිහිස් සලාම්) තුමා ගේ දහම පිළිපදින්නන් යැයි පැවසීමත් කිතුනුවන් ඊසා

(අලෛයිහිස් සලාම්) තුමා ගේ දහම පිළිපදින්නන් යැයි පැවසීමත් සුදුසු නොවේ. යුදෙව් දහම ඇති වූයේ තව්රාතය පහළ වී ශත වර්ෂ ගණනාවක ට පසුව ය. කිතුනු දහමත් එලෙසම ය.

කෙසේ වෙතත් දැන ට යුදෙව්වන් හා කිතුනුවන් පිළිපදින දහම මිථ්‍යා ප්‍රබන්ධයෙන් යුත් දහමකි. අලුත් දෑ එක් කළ දහමකි. දෙවියන් ගේ කීර්තිය ට ඔහු ගේ නාම වලට ඔහු ගේ ගුණාංග වලට කැළලක් ගෙන දෙන පරිදි නොයෙකුත් වෙනස් කිරීම් විකෘති කිරීම් නවීකරණයන් ප්‍රතික්ෂේපයන්ගෙන් පිරුණු දහමකි. ඔහු ගේ සත්‍ය දහමක එකකි. එය ඉස්ලාම් ය. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරන සිටියි.

وَمَنْ يَبْتَغِ غَيْرَ الْإِسْلَامِ دِينًا فَلَنْ يُقْبَلَ مِنْهُ وَهُوَ فِي الْآخِرَةِ مِنَ الْخَاسِرِينَ

කවරෙකු ඉස්ලාමයෙන් තොරව වෙනත් දහමක් සොයන්නේ ද එය ඔහුගෙන් පිළි ගනු නොලබන්නේම ය. තව ද ඔහු පරමාන්ත දිනයේ අලාභවන්තයින්ගෙන් කෙනෙකු වෙයි. (අල්-කුර්ආන් 3 : 85)

එබැවින් ඉස්ලාමය පවසා සිටිනුයේ නබි වරුන් වෙත ඔවුන් ගේ පරමාධිපතිගෙන් පැමිණි දෑ පමණක් අප විශ්වාස කළ යුතු බවයි. ඒ හැර සෙසු සියලු දෑ ප්‍රතික්ෂේප කරනු ලබන අසත්‍ය දෑ වෙයි. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

وَقَالُوا كُونُوا هُودًا أَوْ نَصَارَى تَهْتَدُوا قُلْ بَلْ مِلَّةَ إِبْرَاهِيمَ حَنِيفًا وَمَا كَانَ مِنَ الْمُشْرِكِينَ

නුඹලා යුදෙව්වන් වනු. එසේ නොමැති නම් කිතුනුවන් වනු. (එවිට) නුඹලා ඍජු මග ලබන්නෙහු යැයි ඔවුහු (දේව විශ්වාසවන්තයින් ට) ප්‍රකාශ කළෝය. (නබිවරය) එසේ නොව (අප පිළිපදිනුයේ) පිවිතුරු තත්ත්වයෙන් පැවතුණු ඉබ්‍රාහීම් ගේ පිළිවෙත ය. එතුමා ආදේශ තබන්නන් අතුරින් නොවූහ. යැයි පවසනු. (අල්-කුර්ආන් 2 : 135)

යුදෙව්වන් හා කිතුනුවන් දේව ප්‍රතික්ෂේපකයින් ය. දෙවියන් ට ආදේශ තබන්නන් ය. දේව කෝපය ට ලක්වූවන් ය. නොමඟ ගියවුන් ය. එබැවින් ඔවුන් ද සෙසු අය ද සියලු නබි වරුන් ට ඔවුන් ගේ පරමාධිපතිගෙන් පැමිණි පිවිතුරු ඉස්ලාමය විශ්වාස කිරීමත් ඒ අනුව පිළිපැදීමත් අනිවාර්යය වෙයි. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

فَإِنْ آمَنُوا بِمِثْلِ مَا آمَنْتُمْ بِهِ فَقَدِ اهْتَدَوْا وَإِنْ تَوَلَّوْا فَإِنَّمَا هُمْ فِي شِقَاقٍ فَسَيَكْفِيكَهُمُ اللَّهُ وَهُوَ السَّمِيعُ الْعَلِيمُ ، صِبْغَةَ اللَّهِ وَمَنْ أَحْسَنُ مِنَ اللَّهِ صِبْغَةً وَنَحْنُ لَهُ عَابِدُونَ .

නුඹලා කුමන දෙයක් විශ්වාස කළෙහු ද එවන් වූ දැයක් ඔවුන් විශ්වාස කළේ නම් ඔවුහු ඍජු මග ලබන්නෝම ය. ඔවුන් පිටුපාන්නේ නම් ඔවුන්ම ය භේදයෙහි පසුවන්නන්. ඔවුන් ට එරෙහි ව අල්ලාහ් නුඹ ට ප්‍රමාණවත් වෙයි. තව ද ඔහු සර්ව ශ්‍රාවකය. සර්වඥානීය.

(අප වරුණවත් වන්නේ) අල්ලාහ්ගේ සිබ්ගාවෙන් (රන්ජනයෙන්)ය. සිබ්ගාවෙන් අල්ලාහ් ට වඩා අලංකාර වන්නේ කවරෙකු ද? තව ද අපි ඔහු(අල්ලාහ්)ට ම නමදින්නන් වෙමු. (අල්-කුර්ආන් 2 : 137, 138)

ඉබ්රාහීම් නබි තුමා ආදේශ තබන්නෙකු නොවූ බව අල්ලාහ් පැවසූ සේ ම එතුමා යුදෙව්වෙක් හෝ කිතුනුවෙක් හෝ නොවන බව ද අවධාරණය කර සිටියි. එබැවින් මෙම ප්‍රකාශය ඔවුන් දෙපාර්ශවය විසින් පිළිපදින දහම් පිටු දකිනු ලැබිය යුක්තක් බවත් එම දහම් ඔහු ට පසු පැමිණි දේව ප්‍රතික්ෂේපකයින් විසින් නිමයුම් කරන ලද්දක් බවත් පෙන්වා දෙයි. මෙම ආගමික නාමයන් දෙකින් නබි වරුන්ගේ පියා වන ඉබ්‍රාහීම් තුමා වර්ණනා කරනු නොලැබූ බව ද පැහැදිලි ය. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

مَا كَانَ إِبْرَاهِيمُ يَهُودِيًّا وَلَا نَصْرَانِيًّا وَلَـٰكِنْ كَانَ حَنِيفًا مُسْلِمًا وَمَا كَانَ مِنَ الْمُشْرِكِينَ

ඉබ්‍රාහීම් නබි තුමා යුදෙව් ජාතියෙකු හෝ කිතුනු ජාතියෙකු නොවූහ. නමුත් එතුමා අවංක (අල්ලාහ් ට යටහත් වූ) මුස්ලිම්වරයෙකු විය. එමෙන් ම එතුමා ආදේශ තබන්නන් අතුරින් ද නොවීය. (අල්-කුර්ආන් 3 : 67)

- ගෞරවනීය අල්-කුර්ආනය විශ්වාස කිරීමේ හා ඒ අනුව කටයුතු කිරීමේ නීතිය.

ගෞරවනීය අල්-කුර්ආන් නබි වරුන් ගේ මුද්‍රාව වූ ඔවුන් අතුරින් ඉතා ශ්‍රේෂ්ඨ වූ මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා ට අල්ලාහ් පහළ කළ ග්‍රන්ථයකි. එය අවසාන දිව්‍යමය ග්‍රන්ථය වේ. සියලු දෑ පැහැදිලි කරමින් එය අල්ලාහ් පහළ කළේය. මුළු මිනිස් සංහතියට ම මඟ පෙන්වීමක් හා දායාදයක් වශයෙන් පහළ කරනු ලැබීය. එය දේව ග්‍රන්ථ අතුරින් ඉතා උසස්තම දේව ග්‍රන්ථය වෙයි. ශ්‍රේෂ්ඨතම මලක් වරයා වන ජිබ්රීල් (අලෙයිහිස් සලාම්) තුමා විසින් ශ්‍රේෂ්ඨතම මැවීම වන මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් වෙත බිහි වුණු සමාජයන් අතුරින් ශ්‍රේෂ්ඨතම සමාජයක් කෙරෙහි වාග්චාතුර්යතාවකින් සමන්විත ශ්‍රේෂ්ඨතම භාෂාව වන පැහැදිලි අරාබි බසින් ගෙන ආහ.

ගෞරවාන්විත අල්-කුර්ආනය දේව ඒකීයත්වයේ හා දේව විශ්වාසයේ ග්‍රන්ථයකි. එය අල්ලාහ් වෙත ඇරයුම් කරන ග්‍රන්ථයකි. සත්‍යය වෙත මඟ පෙන්වන ග්‍රන්ථයකි. ඥානය හා ප්‍රඥාවෙන් පිරුණු ග්‍රන්ථයකි. කුසල් හා තිළිණ රැස් කර දෙන ග්‍රන්ථයකි. මැවීම් අතුරින් බහුතරයක් කුසල් බලාපොරොත්තුවෙන් පාරායනය කරන ග්‍රන්ථයකි. මහා අභිලාෂයන්ගෙන් ඔවුන් ව තෘප්ත කරවන්නකි.

තව ද ගෞරවනීය අල්-කුර්ආනය එය කියවීම තුළින් නැමදුම ට පත් කරවන්නකි. එය අවබෝධ කිරීම තුළින් ද නැමදුම ට පත් කරවන්නකි. එමෙන් ම ඒ අනුව ක්‍රියා කිරීමෙන් ද නැමදුම ට පත් කරවන්නකි.

එබැවින් සෑම කෙනෙකු ම එය විශ්වාස කිරීමත් එහි ඇති නීති රීති අනුව කටයුතු කිරීමත් එහි පෙන්වා දී ඇති විනයන් පිළිපදිමින් විනයානුකූල ජීවිතයක් ගත කිරීමත් අනිවාර්යය වේ. එය පහළ වීමෙන් පසු එහි මඟ පෙන්වීමෙන් තොරව ඉටු කරන ක්‍රියාව අල්ලාහ් පිළි නොගන්නේ ය. එය ආරක්ෂා කිරීමේ වගකීම අල්ලාහ් භාර ගෙන ඇත. විකෘති කිරීමකින් හෝ වෙනස් කිරීමකින් තොරව එමෙන් ම එකතු කිරීමකින් හෝ අඩු කිරීමකින් තොරව ඉතා සුවදායී ලෙස පත් කර ඇත.

**1-** උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

إِنَّا نَحْنُ نَزَّلْنَا الذِّكْرَ وَإِنَّا لَهُ لَحَافِظُونَ

සැබැවින් ම අපමය මෙම මෙනෙහි කිරීම(අල්-කුර්ආනය) පහළ කළේ. තව ද සැබැවින් ම අපම ය මෙය ආරක්ෂා කරන්නෝ. (අල්-කුර්ආන් 15 : 9)

2- උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

وَإِنَّهُ لَتَنْزِيلُ رَبِّ الْعَالَمِينَ ، نَزَلَ بِهِ الرُّوحُ الْأَمِينُ ، عَلَى قَلْبِكَ لِتَكُونَ مِنَ الْمُنْذِرِينَ ، بِلِسَانٍ عَرَبِيٍّ مُبِينٍ .

තව ද සැබැවින් ම මෙය විශ්වයේ පරමාධිපතිගෙන් වූ පහළ කිරීමකි. (නබිවරය) නුඹ අවවාද කරන්නන් අතුරින් වනු පිණිස නුඹ ගේ හදවත මත පැහැදිලි අරාබි බසින් එය රැගෙන විශ්වාසනීය ආත්මය (ජිබ්රීල්) පහළ විය.

(අල්-කුර්ආන් 26 : 192 – 195)

අල්-කුර්ආන් වැකි වල සාධක

අල්-කුර්ආන් වැකි : සියලු දෑ ඒවායෙ හි විස්තර කර ඇත. එය තොරතුරක් ලෙසින් හෝ ඉල්ලීමක් ලෙසින් හෝ පිහිටයි.

තොරතුරක් ලෙසින් කොටස් දෙකකට බෙදෙයි.

1. මැවුම්කරු පිළිබඳ ව ඔහු ගේ නාමයන් ඔහු ගේ ගුණාංගයන් ඔහු ගේ ක්‍රියාවන් හා ඔහු ගේ ප්‍රකාශයන් පිළිබඳ තොරතුරු දන්වා සිටීම. එනම් ඔහු අති උත්තරීතර අල්ලාහ් ය.
2. අහස් පොළොව අර්ෂ් හෙවත් දිව්‍යම ය රාජධානිය සිහසුන මිනිසා සත්වයා භෞතික වස්තු ගහ කොළ ස්වර්ගය නිරය වැන්නෙහි තොරතුරු ද නබි වරුන් ධර්මදූතයින් ඔවුන් ව අනුගමනය කළවුන් ඔවුන ට

සතුරුවූවන් පිළිබඳ තොරතුරු ද සෑම පිරිසක් ම ලබා ගන්නා ප්‍රතිඵල ගැන තොරතුරු ද මේ හැර සෙසු තොරතුරු ද දන්වා සිටීම.

ඉල්ලීමක් ලෙසින් ද කොටස් දෙකක ට බෙදෙයි.

1. අල්ලාහ් ට පමණක් නමදින මෙන් ද අල්ලාහ් ට හා ඔහු ගේ ධර්ම දූතයා ට අවනත වන මෙන් ද සලාතය උපවාසය වැනි අල්ලාහ් නියම කළ දෑ ඉටු කරන මෙන් ද අණ කිරීම.
2. අල්ලාහ් ට ආදේශ තැබීමෙන් වැළකීම. පොළිය අශික්ෂිත දෑ වැනි අල්ලාහ් තහනම් කළ දෑ ගැන අවවාදයෙන් සිටීම. මේ හැර අල්ලාහ් තහනම් කළ සෙසු දැයින් දුරස් වීම.

එබැවින් ප්‍රධානතම තොරතුරු වන්නේ කීර්තිමත් අල්ලාහ් පිළිබඳ ව වූ දැනුම ය. ප්‍රධානතමය නියෝගය වන්නේ 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යන්න පිළිබඳ දැනුම ය. ප්‍රධානතම තහනම වනුයේ දේව ප්‍රතික්ෂේපය හා දේව ආදේශයෙන් වැළකීම ය. ප්‍රධානතම ප්‍රාර්ථනාව වනුයේ ඍජු මාර්ගය වෙත අප ව මඟ පෙන්වන මෙන් ඇයැද සිටීම ය.

සියලු ප්‍රශංසා හා කෘතඥතාවන් අල්ලාහ්ට ම සතු ය. සියලු භාග්‍යයන් හා පිදීම් ඔහු සතු ය. ඒ අනුව ඔහු අප වෙත ඔහු ගේ උසස් ම ධර්ම දූතයාණන් ව එව්වේ ය. ඔහු ගේ උසස් ග්‍රන්ථය අප වෙත පහළ කළේය. සපැමිණි ජන සමූහයන් අතුරින් උසස් ම ජන සමාජය බව ට අපව පත් කළේය.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.

اللَّهُ نَزَّلَ أَحْسَنَ الْحَدِيثِ كِتَابًا مُتَشَابِهًا مَثَانِيَ تَقْشَعِرُّ مِنْهُ جُلُودُ الَّذِينَ يَخْشَوْنَ رَبَّهُمْ ثُمَّ تَلِينُ جُلُودُهُمْ وَقُلُوبُهُمْ إِلَى ذِكْرِ اللَّهِ ذَلِكَ هُدَى اللَّهِ يَهْدِي بِهِ مَنْ يَشَاءُ وَمَنْ يُضْلِلِ اللَّهُ فَمَا لَهُ مِنْ هَادٍ.

අල්ලාහ් ඉතා අලංකාර උපදේශය ග්‍රන්ථයක් ලෙස පහළ කර ඇත. (එය) එකිනෙකට (පටහැණි නොවූ) එකඟතාවෙන් යුත් නැවත නැවත සඳහන් කරන්නක් ලෙස ද (පහළ කර ඇත.) ඔවුන් ගේ පරමාධිපති ට බිය වන්නන් ගේ චර්ම(යේ රෝම) තැති ගැසෙන්නේ ය. පසුව ඔවුන් ගේ චර්ම ද හදවත් ද අල්ලාහ් ව මෙනෙහි කිරීම පිණිස මෘදු වන්නේය. මෙය අල්ලාහ් ගේ මඟ පෙන්වීමයි. ඔහු අභිමත කරන්නන් ට එමගින් යහ මඟ පෙන්වන්නේ ය. අල්ලාහ් කවරෙකු නොමඟ යන්න ට අත හරින්නේ ද ඔහු ට යහ මඟ පෙන්වන්නෙකු නොමැත. (අල්-කුර්ආන් 39 : 23)